**පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාව**

**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 04 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 සැප්තැම්බර් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, **පච්චිලෙයිපල්ලි** ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට **පච්චිලෙයිපල්ලි** ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත්, මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

වගකීම් හා ආදායම් සම්බන්ධව ගිණුම්වල නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු අවස්ථා හා වටිනාකම් යටතේ පහත වගුවෙන් දැක්වේ.

| | වගකීම් | | ආදායම් | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. |
| ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | 01 | 56,000 | - | - |
| ගිණුම්වල අඩුවෙන් දැක්වීම් | - | - | 01 | 36,000 |

1.3.3 පැහැදිලි නොකළ වෙනසකම්.

ලැබියයුතු ගිණුම් ලෙස රු.714,764 ක මුදලක් මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා තිබුණද, ලේඛනය අනුව ශේෂය රු.594,406ක් ලෙස විය. වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

1.3.4 අවිනිශ්චිත ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ස්වභාවයේ ගිණුම්වල රු.285,431 ක් වටිනා බැර ශේෂයක් විය.

1.3.5 ගෙවියයුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වසර 01 කට වඩා වැඩි කාලපරිච්ජේදයකට අදාළ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.131,809 ක් විය.

1.3.6 අනුකූල නොවීම්.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි නියමයන්ට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන් යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u> | |

| | |
|---|---|
| (i) 132(අ) වගන්තිය | වසරකට රු. 1,000 කට වැඩි ආගමික හා පොදු කටයුතු වෙනුවෙන් දැරූ වියදම්වලට විෂයභාර ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගතයුතුය. ඇමතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව වැඩිහිටි දිනය සඳහා පරිත්‍යාග ලෙස රු.9,000 ක මුදලක් ලබා දී තිබුණි. |
| (ii) 19(1) වගන්තිය | නිශ්චල හා චංචල වත්කම් සම්බන්ධ ලේඛනයක් සභාව විසින් පවත්වා නොතිබුණි. |

(ආ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>

| | |
|---|---|
| (i) අංක 104 | සභාවේ වාහන අනතුරක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. හානියේ වටිනාකම රු.4,199,534 ක් විය. |
| (ii) අංක 571 | නිරවුල් කිරීමකින් තොරව සභාව විසින් කල් ඉකුත් වූ තැන්පතු, විවිධ තැන්පතු ගිණුමෙහි රඳවා තබා ගෙන තිබුණි. |
| (iii) අංක 685 | සභාවේ ට්‍රැක්ටරය අලුත්වැඩියාව සඳහා ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි. |
| (iv) අංක 1645 | සභාව විසින් වාහන ලොග් පොත් නිසි පරිදි නොතිබුණි. |

(ඇ) <u>චක්‍රලේඛ</u>

| | |
|---|---|
| (i) 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2010 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙහි ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස වාර්තා කර තිබූ ද්‍රව්‍යයන් සම්බන්ධ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 04ක ඉන්ධන දැවීම මාස 06 කට වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| (ඈ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය | මුදල් රඳවා ගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරුට අවසාන ගෙවීම සිදු කර තිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 1,690,373 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 1,509,365 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම.

සභාපති විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම සම්බන්ධ තොරතුරු පහත දැක්වේ. යුද වාතාවරණය හේතුවෙන් සභාව විධිමත් ලෙස ක්‍රියාත්මක වී නොතිබුණු නිසා සභාව 2009 වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තත්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ | 2009 ඇස්තමේන්තුගත | 2009 තත්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 05 | - | 294 | - | - | 294 |
| බදු කුලී | 780 | 748 | - | - | - | - |
| බලපත්‍ර ගාස්තු | 60 | 62 | - | - | - | - |
| වෙනත් ආදායම් | 16,990 | 13,506 | 305 | - | 6,991 | 305 |

2.2.2 උසාවි දඩ

කිළිනොච්චි දිස්ත්‍රික් මහේස්ත්‍රාත් උසාවියෙන් ලැබියයුතු උසාවි දඩ සභාව විසින් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 මද්දර ගාස්තු.

ලැබියයුතු මුද්දර ගාස්තු ගණනය කර, අදාළ විස්තර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට යැවීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබූ ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු 16 කින් රු.172,695 ක් වූ ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව 2010 නොවැම්බර් 02 දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂණයකදී අනාවරණය විය.

### 2.2.5 අයකර ගතයුතු සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු සේවක ණය ශේෂවල එකතුව රු.2,281,050 ක් වූ අතර, වසර 1 කට වඩා වැඩි කාලපරිච්ඡේදයක් වෙනුවෙන් හිඟව පවතින ශේෂයේ වටිනාකම රු.1,503,600 ක් විය.

## 2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තත්‍ය වියදම් විචලනයන් සමඟ පහත දැක්වේ. යුද කටයුතු හේතුවෙන් සභාව විධිමත් ලෙස ක්‍රියාත්මක වී නොතිබුණු නිසා සභාව 2009 වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තත්‍ය | විචලනය | අයවැයගත | තත්‍ය | විචලනය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පුද්ගල පඩිනඩි | 15,259 | 11,257 | 4,002 | - | 5,389 | (5,389) |
| වෙනත් | 2,194 | 1,369 | 825 | - | 92 | (92) |
| උප එකතුව | 17,453 | 12,626 | 4,827 | - | 5,481 | (5,481) |
| ප්‍රාග්ධන වියදම් | 9,386 | 5,711 | 3,675 | - | 1,331 | (1,331) |
| මුළු එකතුව | 28,839 | 18,337 | 8,502 | - | 6,812 | (6,812) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය.

### 2.4.1 අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තත්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 03 | - |

| | | |
|---|---|---|
| ද්වීතියික මට්ටම | 16 | 14 |
| ප්‍රාථමික මට්ටම | 33 | 26 |
| වෙනත් (අනියම් / තාවකාලික ) | - | 10 |
| එකතුව | 52 | 50 |

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 ලැබිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 4,999,682 ක් වූ අතර වසර 01 කට වඩා වැඩි කාල පරිච්ඡේදයකට අදාල ගිණුම් ශේෂවල වටිනාකම රු. 2,238,484 ක් විය.

2.5.2 අයකර ගත යුතු සේවක ණය.

2010 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු සේවක ණය ශේෂවල එකතුව රු. 2,281,050 ක් වූ අතර වසර 01 කට වඩා වැඩි කාල පරිච්ඡේදයකට අදාල ගිණුම් ශේෂවල වටිනාකම රු. 1,503,600 ක් විය.

2.6 අවිධිමත් ගනුදෙනු

විගණනයේ දි නිරීක්ෂණය වූ අවිධිමත් ගනුදෙනුවට වටිනාකම රු.41,000 ක් විය. විස්තර පහත දැක්වේ.

| ගනුදෙනුව | වටිනාකම (රු.) |
|---|---|
| පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් දෙන ලද ප්‍රදාන , පාසල් ළමුන් සඳහා දන්තාලේප සහ බුරුසු සැපයීමට සභාව විසින් යොදවා තිබුණි. | 41,000 |

2.7 කාර්ය සාධනය.

සභාව විසින් වාර්ෂික ක්‍රියාකාර් සැලැස්මක් ගිණුම් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි. එමනිසා අපේක්ෂිත ඉලක්ක ඉට කර ගැනීමේ ප්‍රගතිය නිශ්චිතව දැන ගැනීමට නොහැකි වී තිබුණි

2.8 අභ්‍යන්තර විගණනය.

ප්‍රාදේශීය සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලනය.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය